Australian Government
Department of Home Affairs

# කාලීන සේවකයා

## කෝවිඩ්-19 පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර

ඔබට වීසා බලපත්‍රයක් නැති වුවද, නැතිනම් ඔබගේ වීසා බලපත්‍ර තත්වය සම්බන්ධයෙන් පැහැදිලි නැතිනම්, ඔබ විසින් මහජන සෞඛ්‍ය විධාන අනුගමනය කළ යුතුය. ඔබට අසනීප නම්, වෛද්‍ය උපදෙස් ලබා කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්ෂා කර ගන්න.

ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන් මගින් කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර ලබාදීම සිදු කෙරේ.

- ඕස්ට්‍රේලියන් කැපිටල් ටෙරිටරි
- නිව් සවුත් වේල්ස්
- නොදර්න් ටෙරිටරි
- ක්වීන්ස්ලන්ඩ්
- සවුත් ඕස්ට්‍රේලියා
- තස්මේනියා
- වික්ටෝරියා
- වෙස්ටර්න් ඕස්ට්‍රේලියා

## මම කාලීන සේවක හෝ පැසිෆික් ශ්‍රම වැඩසටහන හා සම්බන්ධවන අයෙකි

### පැසිෆික් ශ්‍රම වැඩසටහනේ උපකාණ්ඩ 403 වීසා බලපත්‍රධාරීන්

ඔබ සහ ඔබගේ සේවායෝජකව subclass 403 visa in the Pacific Labour Scheme වැඩසටහන හා සම්බන්ධවීමට විදේශ කටයුතු සහ වෙළඳ දෙපාර්තමේන්තුව මගින් පිළිගෙන ඇතිනම් ඔබට එම වැඩසටහන යටතේ වීසා බලපත්‍රයකට අයදුම් කළ හැකිය. මෙම වීසා බලපත්‍රය මගින් ඔබට නැවත ඔබගේ රටට යාමට හැකිවන තෙකක් අවශ්‍ය නම්, දිගටම ඕස්ට්‍රේලියාවේ නීත්‍යානුකූලව සිටීමටත් දිගටම වැඩ කරගෙන සිටීමටත් හැකියාව ලැබේ.

### කාලීන සේවක වැඩසටහන යටතේ උපකාණ්ඩ 403 වීසා බලපත්‍රධාරීන්

ඔබගේ වීසා බලපත්‍රය දික්කල නොහැක. කෙසේවුවද, කෝවිඩ්-19 ට ප්‍රතිචාර වශයෙන් තීරණාත්මක අංශවල වැඩ කරන අය සඳහා ඕස්ට්‍රේලියානු රජය මගින් නව ක්‍රියාමාර්ග හඳුන්වාදී ඇත.

කෝවිඩ්-19 වසංගත කාලය තුළදී පහත අවශ්‍යතාවයන් සපුරාලයි නම්, ඔබ විසින් Temporary Activity (subclass 408) Australian Government Endorsed Event (AGEE) stream visa (COVID-19 Pandemic event visa) වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට සුසුසුකම් තිබිය හැකියඃ

- ඔබගේ වීසා බලපත්‍රයයේ කාලය ඉකුත්වීම දින 28 කින් හෝ ඊට අඩු කාලයකදී සිදුවේනම්
- ඔබගේ වීසා බලපත්‍රයේ කාලය දැනටමත් ඉකුත්වී ඇතිමුත් දින 28 කට වඩා වැඩි නොවේනම්
- ඔබට ඕස්ට්‍රේලියාවෙන් පිටතට යාමට නොහැකිනම්
- ඔබ සෞඛ්‍යය, වයෝවෘද්ධ රැකවරණ හෝ කෘෂිකර්මාන්තය වැනි තීරණාත්මක අංශයක වැඩ කරයි නම්.

මෙම වීසා බලපත්‍රය මගින් ඔබට නැවත ඔබගේ මව්බිමට යාමට හැකියාව ලැබෙන තුරු ඕස්ට්‍රේලියාවේ නීත්‍යානුකූලව සිටීමටත්, දිගටම වැඩ කරගෙන සිටීමටත්, ඉඩකඩ ලබාදේ. කාලීන සේවක වැඩසටහන සහ පැසිෆික් ශ්‍රම වැඩසටහනේ වැඩපිළිවෙලවල්, සේවායෝජකයන් ඇතුළුව, නව වීසා බලපත්‍රයටද අදාලවේ.

## වෙනත් සේවායෝජකයෙකු සමඟ වැඩ කිරීම

කාලීන සේවක වැඩසටහනේ සහ පැසිෆික් ශ්‍රම වැඩසටහනේ සේවකයන් හට ස්වදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් අවසර ලබා දුන්නේ නම් මිස, සාමාන්‍ය වශයෙන් අවසර ඇත්තේ එක් අනුග්‍රහකයෙකු/අනුමත කල සේවකයෙකු සමඟ වැඩ කිරීම සඳහාවේ.

කෝවිඩ්-19 කාලයේදී, අනුග්‍රහකයන්/අනුමත කල සේවකයන් අතර මාරුවිය හැකිය. ඔබට අනුග්‍රහකයන්/අනුමත කල සේවකයන් අතර මාරුවීමට අවශ්‍ය නම්, ඔබගේ සේවායෝජකයා පහතා අය සමඟ සම්බන්ධ විය යුතුයඃ

- ඔබ කාලීන සේවකයෙකු නම්, අධ7ාපන, නිපුණතා සහ රැකියාදෙපාර්තමේන්තුව
- ඔබ පැසිෆික් ශ්‍රම වැඩසටහන යටතේ වැඩ කරන්නේ නම්, විදේශ කටයුතු සහ වෙළද දෙපාර්මේන්තුව.

මෙම වැඩපිළිවෙලවල් යටතෙ, සේවකයන් විසින් සියළුම ඕස්ට්‍රේලියානු රාජකාරී ස්ථාන නීතිවලට අනළුකූලව කටයුතු කලයුතු අතර වෙනත් සියළුම සේවකයන් මෙන්ම ඕස්ට්‍රේලියානු රාජකාරී ස්ථාන නීතිය යටතේ ඇති සියළුම අයිතිවාසිකම්වලට දිගටම හිමිකම් කියනු ඇත.

## වීසා කොන්දේසි 8503 (තවදුරටත් රැඳී සිටිය නොහැක)

කොවිඩ්-19 කාලයේදී කාලීන සේවක වැඩසටහන යටතේ උපකාණ්ඩ 403 වීසා බලපත්‍ර සඳහා COVID-19 Pandemic event visa බලපත්‍රයකට අයදුම් කිරීමට ඉඩ ලබාදීම සඳහා ඔබගේ වීසා බලපත්‍රයේ ඇති 8503 කොන්දේසිය (තව දුරටත් රැඳී සිටිය නොහැක) ස්වයංක්‍රීයවම ඉවත් වනු ඇත.

8503 කොන්දේසිය ඉවත් කිරීම සඳහා ඔබ විසින් ඉල්ලා සිටිය යුතු නැත.

## දැනට ඇති වීසා බලපත්‍ර මත රැඳී සිටිය හැකි කාල

දැනට ඇති වීසා බලපත්‍රයක් මත රැඳී සිටිය හැකි කාලය දීර්ඝකල නොහැක. ඔබ තවදුරටත් ඕස්ට්‍රේලියාවේ රැඳී සිටින්නේ නම්, ඔබගේ වීසා බලපත්‍ර කාලසීමාවේදී එය අවසානයට පත්වේ. ඔබගේ රැඳී සිටීමේ කාලය අවසාන වීමට පෙර ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යා නොහැකි නම්, ඔබට ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යාමට හැකිවන තෙක් නීත්‍යානුකූලව සිටීම සඳහා වෙනත් වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය.

ඔබගේ අවස්ථානුගත කරුණු ඔබගේ සේවායෝජකයා සමඟ සාකච්ඡා කර ගත යුතුය. කාලීන සේවකයන් හට දිගින් දිගට පවතින වැඩ අවස්ථා ලබාදීම සඳහා සහ ඔවුන් ආරක්ෂාකාරීව සහ ඔවුනට යපකාර ලබාදෙන බව සනාථ කිරීම සඳදහා අධ්‍යාපන, කුසලතා සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව අනුමත කල සේවා යෝජකයන් සමඟ එක්ව කටයුතු කරයි.

සංචාරක වීසා බලපත්‍රයක් ඇතුළුව වෙනත් වීසා බලපත්‍රයක් යොමු කිරීමට අවශ්‍යතා සපුරාලන්නේ නැතිනම්, ඔබ හට COVID-19 Pandemic event visa සඳහා අයදුම් කිරීමට සුදුසුකම් තිබිය හැකිය.

ඔබ හට වෙනත වීසා බලපත්‍රයක් සඳහා අවශ්‍ය සුදුසුකම් නැත්තේ කුමන හේතුව නිසාද යන්න පෙන්වා දිය යුතුය. මෙයට ඔබ විසින් වෙනත් වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට අවශ්‍ය ගාස්තුව සපයා ගැනීමට ප්‍රමාණවත් අරමුදල් නැති බවට බවට ප්‍රකාශයක් සහ සාක්ෂි තිබිය හැක.

## නිරෝධායන අවශ්‍යතා

සියළුම වීසා බලපත්‍රධාරීන් විසින් සමාජ දුරස්ථභාවය සහ ස්වයං හුදෙකලාවීම ඇතුළු කෝවිඩ්-19 සෞඛ්‍යය ක්‍රියාමාර්ග අනුගමනය කල යුතුය.

කෘෂිකාර්මාන්ත ක්ෂේත්‍රයේ වැඩ කරන තාවකාලික බලපත්‍රදාරීන් අතර කෝවිඩ්-19 පැතිරෙන්නේ නැතිවීම සඳහා නිරෝධායන සහ ස්වයං හුදෙකලාවීම සම්බන්ධ අවශ්‍යතා සම්බන්ධ වගකීම ඇත්තේ ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන් වෙතය.

මහජන සෞඛ්‍යය සහ නිරෝධායන නීතිවලට අනුව කටයුතු නොකරන වීසා බලපත්‍රධාරීන් සම්බන්ධයෙන් ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන් මගින් ස්වදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම් කලයුතු අතර ඒ මගින් අනවශ්‍ය සෞඛ්‍යය අවදානක් ඇති අයගේ වීසා බලපත්‍ර අවලංගු කිරීමට කටයුතු කල හැකිය.

එක් එක් ප්‍රාන්ත සහ ටෙරිටරි රජයේ නීති සම්බන්ධ තොරතුරු සඳහා පහත පුරුක් වෙත යන්නඃ

- ඕස්ට්‍රේලියන් කැපිටල් ටෙරිටරි (Australian Capital Territory (ACT)) - https://www.health.act.gov.au/
- නිව් සවුත් වේලස් (New South Wales (NSW)) - https://www.health.nsw.gov.au/Pages/default.aspx

- වික්ටෝරියා (Victoria (VIC)) - https://www.dhhs.vic.gov.au/
- ක්වීන්ස්ලන්ඩ් (Queensland (QLD)) - https://www.health.qld.gov.au/
- වෙස්ටර්න් ඕස්ට්‍රේලියා (Western Australia (WA)) - https://www.health.wa.gov.au/
- සවුත් ඕස්ට්‍රේලියා (South Australia (SA)) - https://www.sahealth.sa.gov.au/
- නොදර්න් ටෙරිටරි (Northern Territory (NT)) - https://health.nt.gov.au/
- තස්මේනියා (Tasmania (TAS)) - https://dhhs.tas.gov.au/

**මූල්‍ය දුෂ්කරතා අත්දකින වීසා බලපත්‍රධාරීන්**

ඔබගේ කටයුතු කරගෙන සිටිය නොහැකි නම්, සිය මව්බිම කරා යාමට කටයුතු පිළියෙල කරගත යුතුය.

ඔබගේ ජීවන වියදම උපයාගත නොහැකිනම්, 2019-20 මූල්‍ය වර්ෂයේදී බදුවලට යටත් නොවී $10,000 දක්වාවූ මුදලක් විශ්‍රාම පාරිතෝෂික මුදලින් ලබාගත හැකිය